# බස්නාහිර පළාතේ පළාත් සභාවේ වසර 2000 අංක 08 දරණ
# සෞඛ්‍ය සේවා ප්‍රඥප්තිය

බස්නාහිර පළාතේ ජනතාවගේ සෞඛ්‍ය තත්ත්වය නගා සිටුවීම සහ සංරක්ෂණය සඳහා අවශ්‍ය සේවා විධිමත්ව පවත්වාගෙන යාහැකි පරිදි බස්නාහිර පළාතේ සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවක් පිහිටුවීම සඳහා විධිවිධාන සැලැස්වීම පිණිසත්, එයට සම්බන්ධ වු හෝ ආනුෂාංගික කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිසත් වු ප්‍රඥප්තියකි.

මෙම ප්‍රඥප්තියෙහි විධිවිධාන 1952 අංක 12 දරන සෞඛ්‍ය සේවා පනත හා අනුකූල වේ.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ බස්නාහිර පළාතේ පළාත් සභාව විසින් මෙසේ පනවනු ලැබේ.

ලුහුඬු නාමය ක්‍රියාත්මක වන දිනය

01. මෙම ප්‍රඥප්තිය බස්නාහිර පළාතේ පළාත් සභාවේ 2000 අංක 08 දරණ සෞඛ්‍ය සේවා ප්‍රඥප්තිය යනුවෙන් හදුන්වනු ලබන අතර, එය ආණ්ඩුකාරවරයාගේ අනුමැතිය ලබන දින සිට ක්‍රියාත්මක වන්නේය. (පුර්ණ කාරක සභාවේදි සලකා බලන ලදි.)

## 1 වන කොටස
## පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව පිහිටුවීම - එහි සංයුතිය හා කාර්යභාරය

පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව පිහිටුවීම

02. (1) මෙම ප්‍රඥප්තියෙහි සිද්ධාන්තයන් හා අරමුණු ක්‍රියාත්මක කිරීම සඳහා මතු දැක්වෙන විධිවිධාන අනුව (මින් මතු " දෙපාර්තමේන්තුව" යනුවෙන් හඳුන්වනු ලබන) පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවක් පිහිටුවනු ලැබේ. මෙම දෙපාර්තමේන්තුව සඳහා කාර්ය මණ්ඩලය පත් කිරීම, ස්ථාන මාරු කිරීම සහ විනය පාලනය, අවශ්‍ය වන පරිදි පළාත් ආණ්ඩුකාරවරයා හෝ ඔහු විසින් විධිමත්ව බලය පවරන ලද බලධරයා විසින් කළ යුතු වන්නේය.

(2) රජය මගින් දැනට දිප ව්‍යාප්ත සේවාවන් ලෙස ප්‍රකාශ කොට ඇති සේවාවන් යටතට ගැනෙන කිසිදු නිලධාරියෙකු කෙරෙහි ඉහත උප වගන්තිය (1) සඳහන් පත්කිරීම, ස්ථාන මාරු කිරීම සහ විනය පාලනය යන කරුණු බලනොපානු ඇත.